00346

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
ද්විතීයික හා තෘතියික අධ්‍යාපන අධ්‍යනාංශය
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන - 2021/2022
අවසාන පරීක්ෂණය - 2023
**STP8207/STP8307/ESP2107 - විෂයමාලා න්‍යාය හා පරිචය**
කාලය - පැය තුනයි (03).

---

දිනය - 2023.11.25 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**I වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද 2 වන කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකටද (03) පිළිතුරු සපයන්න.**

## I වන කොටස

01. විෂයමාලා අධ්‍යයනය ගුරුවරුන්ට වැදගත් බව පෙන්වීමට හේතු හතරක් (04) ලියන්න.

02. විෂයමාලා සංවර්ධන ආකෘතියක් යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

03. නිදසුන් දෙකක් (02) දක්වමින් අව්ධිමත් විෂයමාලාවක් යන්නෙන් කුමක් අදහස් වේද යන්න පැහැදිලි කරන්න.

04. විෂයමාලා සංවිධාන රටා හෝ ප්‍රවේශ හතර (04) ලැයිස්තු ගත කර, ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

05. "පාසල් විෂයමාලාව සංවර්ධනය කිරීමේ දී මනෝවිද්‍යාත්මක පදනම් සැළකිය යුතුයි." කෙටියෙන් සාකච්ඡා කරන්න.

06. පාසල් විෂයමාලා කළමනාකරණයේ දී විදුහල්පතිවරයාගේ භූමිකාවේ වැදගත්කම කෙටියෙන් සාකච්ඡා කරන්න.

07. 'ඉගෙනුමට ඉගෙනුම' නිපුණතාව සහතික කිරීම සඳහා පාසල් ගුරුවරයකුට සිදුකළ හැකි මැදිහත්වීම් තුනක් (03) දක්වන්න.

08. වර්ෂ 1981 අධ්‍යාපන ධවල පත්‍රිකාව මගින් සිදුකළ විෂයමාලා ප්‍රතිසංස්කරණ දෙකක් (02) දක්වන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) විෂයමාලාව පිළිබඳ පිළිගත් නිර්වචන දෙකක් (02) දක්වන්න. (ලකුණු 04)

(ii) එම නිර්වචන විශ්ලේෂණය කර, ඒවාට අනුව විෂයමාලාවක මූඛ්‍ය ලක්ෂණ හඳුනා ගන්න. (ලකුණු 06)

(iii) ඒ අනුව විෂයමාලාව යන්නට ඔබගේ නිර්වචනයක් නිර්මාණය කරන්න. (ලකුණු 04)

(iv) ඔබ නිර්වචනය කළ ආකාර විෂයමාලාවක් ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ දෙන අභියෝග තුනක් (03) හඳුනා ගන්න. (ලකුණු 06)

10. (i) විෂයමාලාව අරමුණු සකස් කිරීමේ දී සැළකිල්ලට ගනු ලබන මූලාශ්‍ර නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) විෂයමාලාවක පරමාර්ථ හා අරමුණු තීරණය කිරීමේ ක්‍රියාවලිය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) 1998 අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල අරමුණු දෙකක් **(02)** සඳහන් කර නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 04)

11. (i) ටයිලර් ගේ විෂයමාලා සංවර්ධන ආකෘතිය ඇඳ පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) ටයිලර්ගේ විෂයමාලා සංවර්ධන ආකෘතියෙහි දුර්වලතා තුනක් **(03)** දක්වන්න. (ලකුණු 06)

(iii) වීලර් ගේ විෂයමාලා සංවර්ධන ආකෘතිය පැහැදිලි කර, ටයිලර්ගේ විෂයමාලා සංවර්ධන ආකෘතියෙහි දුර්වලතා, වීලර්ගේ ආකෘතිය මගින් නිවැරදි කර ඇත්තේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 08)

12. (i) විෂය සමගාමී ක්‍රියාකාරකම් යනු මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) සිසුන්ගේ සමස්ථ සංවර්ධනය සඳහා විෂය සමගාමී ක්‍රියාකාරකම්වල වැදගත්කම අගයන්න. (ලකුණු 06)

(iii) විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා සිසු සහභාගිත්වය ඉහළ නැංවීම සඳහා ගත හැකි ක්‍රමෝපායයන් තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 09)

13. (i) 'සමාජ වෙනස්වීම' යනුවෙන් කුමක් අදහස් වේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) සමාජීය අවශ්‍යතා සපුරාලීම පාසල් අධ්‍යාපනයෙහි අරමුණක් වීමේ වැදගත්කම පරීක්ෂා කරන්න. (ලකුණු 08)

(iii) සමාජ වෙන්වීම පාසල් විෂයමාලාවට බලපෑම් කළ ආකාරය පසුගිය වසර කීපය තුළ සිදු වූ විවිධ විෂයමාලා වෙනස්කම් සුදුසු නිදසුන් හතරක් **(04)** සපයමින් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

14. (i) 'විෂයමාලා ඇගයීම' යනුවෙන් කුමක් අදහස් වේදැයි විස්තර කරන්න. (ලකුණු 03)

(ii) ඔබ පාසල් සංදර්භය තුළ ක්‍රියාත්මක කෙරෙන විෂයමාලා වැඩසටහනක්/අංගයක් ඇසුරින් නිදසුන් දක්වමින්, ටයිලර්ගේ අරමුණු පාදක විෂයමාලා ඇගයීම් ආකෘතියෙහි පියවර සාකච්ඡා කරන්න. (ලකුණු 14)

(iii) විෂයමාලා ඇගයීම් කරුවකු, සතුවිය යුතු ගුණාංග පහක් **(05)** අගයන්න. (ලකුණු 03)

හිමිකම් ඇවිරිණි.